# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 අගෝස්තු මස 09 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.08.13 දින නිකුත් කරන ලදී)


# සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**(129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු (වෛද්‍ය) සුදර්ශිනි ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# සාප්පු සහ කාර්යාල සේවක
# (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

**(129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක      දරන සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(129 වන පරිච්ඡේදයේ 18(ආ) වගන්තිය සංශෝධනය කිරීම

**2.** (129 වන අධිකාරය වූ) සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනතේ 18(ආ) වැනි වගන්තිය එම වගන්තියේ (2)(ඇ) සහ (2)(ඈ) උපවගන්ති ඇතුළත් කිරීම මගින් පහත පරිදි සංශෝධනය කෙරේ:-

"(ඇ) ගබ්සාව සිදු වූ දින සිට දින හතක්, ගැබ්ගැනීමෙන් පළමු සති විසි අට තුළ ගබ්සාව සිදු වුවහොත්; සහ

(ඈ) කිසියම් නීතිමය හෝ වෛද්‍යමය හේතුවක් මත ගැබ් ගැනීම අවසන් වුවහොත් සහ එසේ සිදු වූ දින සිට දින හතක්.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.